**මේජර් ජෙනරාල් එස් හාර්ට්සෙල් 2017 ඉන්දියන් සාගර සම්මන්ත්‍රණයේදී පවත්වන ලද කථාව**

සුභසන්ධ්‍යාවක් නෝනාවරුනි මහත්වරුනි, එක්සත් ජනපද පැසිෆික් කළාපීය අණදෙන නිලධාරී අද්මිරාල් හැරිස් නියෝජනය කරමින් අද දින මෙහි පැමිණීමට ලැබීම පිළිබඳව මා ඉතාමත් සතුටට පත්වෙනවා. අද දින මෙහි පැමිණීමට නොහැකිවීම සම්බන්ධයෙන් ඔහු කණගාටු වන අතර මෙම අවස්ථාවට ඔහුගේ උණුසුම් සුභපැතුම් එක්කරනවා. සංවිධායක කමිටුවටත් කමිටුවේ සභාපතිවරයා වන ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය වික්‍රමසිංහ මහතාටත් මෙම අවස්ථාව සංවිධානය කිරීම වෙනුවෙන් දරණ ලද අතිමහත් ප්‍රයත්නය වෙනුවෙන් මා ස්තුතිවන්ත වෙනවා. ලෝකයේ සම්බන්ධතාවන් දිනෙන් දින වර්ධනය වන අතර එකිනෙකාගේ සහයෝගයෙන් සහ විවිධ පාර්ශවයන් සමග එක්ව කටයුතු කිරීමෙන් විසඳා ගතයුතු අඛණ්ඩ අභියෝගයන් රැසකට අපි මුහුණ දෙනවා. අපගේ රටවල් වලට ජාතීන්ට බලපාන්නා වූ ප්‍රශ්න සම්බන්ධයෙන් ගැඹුරෙන් අවධානය යොමු කොට ඒවා විශ්ලේෂණය කිරීම සඳහා මෙවැනි සමුළු අපට ඉතා වැදගත් වෙනවා. විශේෂයෙන්ම හුදෙක් ප්‍රශ්න මතුපිටින් පමණක් විමසා බැලෙන ක්ෂණික පුවත් හා හඬ පට බිහිවෙන මෙවැනි කාලයක, ඒ වෙනුවෙන් අපි විශේෂ යමක් කළ යුතුයි.

ඉන්දිය සාගරය උපායමාර්ගික වශයන් අතිශයින් වැදගත් බව අද උදැසන මෙහි රැස්වී සිටින සියලුම දෙනා හොඳින් දන්නවා. මෙම තත්වය නාවික ගමනාගමනයේ ඈත අතීතයේ සිටම එනම් මෝසම් සුළංදහරාවන් මගින් නැගෙනහිර ආසියාව, අරාබි අර්ධද්වීපය සහ නැගෙනහිර සහ දකුණු අප්‍රිකාව අතර නාවික සම්බන්ධතා ඇතිවූ කාලයේ සිට අදවන තෙක් පවතිනවා. අද වන විට ලෝකයේ බහාලුම් නෞකා වලින් අඩක්, විශාල භාණ්ඩ තොග ප්‍රවාහනයෙන් තුනෙන් එකක් සහ ලෝකයේ ඛනිජතෙල් ප්‍රවාහන නෞකාවලින් තුනෙන් දෙකකට ආසන්න ප්‍රමාණයක් මෙම සාගර කළාපයේ ගමන් කරනවා. මෙවැනි මට්ටමක වාණිජ කටයුතු සිදුවන විට ආරක්ෂාව සම්බන්ධ කරුණු ගණනාවක් පැනනගිනවා.

ඉන්දීය සාගර කළාපය දෙස බලන විට එයට එම සාගර කළාපය තුළ සහ ඉන් පරිබාහිරව පිහිටා තිබෙන රටවල් වල භූගෝලීය උපාය මාර්ගික අවධානයට යොමුවී ඇතිබව පෙනීයනවා. ලෝකයේ විශාලතම ආර්ථිකයන් තුනෙන් දෙකක් එනම් චීනය සහ ජපානය තවත් රටවල් ගණනාවක් සමගින් මෙම සාගර කළාපයේ සම්පත් සහ වෙළඳාම පිළිබඳව අවධානය යොමුකර තිබේ. මෙමම තත්වය රටවල් අතර තරගකාරීතත්වයකට සහ සහයෝගීතාවයන් ඇතිවීමට මගපාදයි.

ඉන්දීය, ආසියානු සහ පැසිෆික් කලාපයේ ආර්ථිකයන් පිබිදීමට රුකුලක්වී ඇත්තේ අන්තර්ජාතික නීතිරීතිවලට සහ ප්‍රමිතීන් වලට අපි ගරු කිරීමත් ඒවාට අනුකූලව කටයුතු කිරීමත් නිසා වර්තමානයේ දිගුකාලයක් පුරා සාමයත් සෞමද්ධියත් ඇතිවීම නිසා බව මෙහිදී සඳහන් කළයුතුවේ,

වසර 70 කට වඩා කළාපයේ ආරක්ෂාව තහවුරු වීම සහ ස්ථාවරත්වය නිරායාසයෙන් ඇතිවූවක් නොවේ. මේ තත්වයන් අහඹුවෙන් සිදුවූ ඒවා නොවේ. මේවා විශාල හෝ කුඩා සියලු ජාතීන් විසින් මූලධර්ම පදනම් කරගත් නෛතිකභාවයෙන් යුත් අන්තර්ජාතික පද්ධතීන්ට අනුකූලව ක්‍රියාකිරීම මගින් සාමුහිකව දිනාගත් ජයග්‍රහණයන් වේ.

එක්සත් ජනපදයේ ආරක්ෂක ලේකම් මැටිස් පසුගිය මාසයේ දී පැවැත්වුනු ෂැන්ග්‍රිලා ඩයලොග් හිදී ප්‍රකාශකළ ආකාරයට "මෙම අන්තර්ජාතික නියෝග එක් එක් ජාතීන් වෙන වෙනම පැනවූ ඒවා නොවේ. සියලු දෙනාට වඩාත් යහපත් ලෝකයක් ගොඩනැංවීම සහ සියලුදෙනාටම නැවත බලාපොරොත්තුවක් ඇතිකරගැනීම සඳහා මූලධර්මයන් පදනම් කරගෙන සියලු ජාතීන් විසින් මේවා ගොඩනගා තිබෙනවා".

යුද්ධ සහ සිවිල් නැව්වලට නිදහසේ නාවික කටයුතුවල යෙදීමේ හැකියාව, අර්බුදයන් සාමකාමීව විසඳා ගැනීම සහ බාධාවකින් තොරව නීත්‍යානුකූල වෙළඳකටයුතු සිදුකිරීමද ඇතුළත් මෙම මූලධර්ම මගින් නීතිරීති මත ගොඩනැංවූ අන්තර්ජාතික නියෝගයන්ට පදනම දමන අතර එමගින් පසුගිය දශක හතක කාලය පුරා බිලියන ගණනාවක් ජනතාව දරිද්‍රතාවයෙන් මුදාගැනීමටත් ජාතීන් ගණනාවකට ප්‍රතිලාභ අත්කරදීමටත් හේතුවිණි.

මෙම පද්ධති පිළිගැනීම අභියෝගයට ලක්වෙමින් පවතී. කෙසේවෙතත් බොහොමයක් රටවල් වලට මෙමගින් ප්‍රතිලාභ ඇතිවී තිබේ. අවාසනාවකට මෙන් සමහර රටවල් අන්තර්ජාතික පද්ධතීන් ශක්තිමත් කරන්නාවූ  පිළිගත් වැඩසැලැස්ම සහ ප්‍රමිතීන්, නීති රීති සහ එයට සහාය දෙන්නාවූ ආරක්ෂක ජාලයට අනුව කටයුතු කිරීම  ප්‍රතික්ෂේප කරනු ලබන  අතර ඒ වෙනුවට තමාට පමණක් ප්‍රතිලාභ ගෙනදෙන්නාවූ ක්‍රියාමාර්ග අනුගමනය කරති .

මෙවැනි තත්වයක් දකුණු චීන මුහුදේ ඇතිවන බව අපි නිරීක්ෂණය කළෙමු. නාවික ගමනාගමනයට අභියෝගයන් ඇතිකරමින් සහ පිළිගත් අන්තර්ජාතික අධිකාරියේ තීරණ වලට පටහැනිව ක්‍රියාකරමින් චීනය ඔවුන්ගේ යුධ සහ ආර්ථික බලය දකුණු චීන මුහුදේ නිදහසේ නාවික කටයුතු කිරීම සීමා කිරීමට යොදාගනු ලබයි. මෙහි ප්‍රතිපලයක් වශයෙන් නීතිරීති පදනම් කරගත් අන්තර්ජාතික නියෝග වලට බලවත් හානි පැමිණේ.

අර්බුදයට ලක්ව තිබෙන  දකුණු චීන මුහුදේ නාවික ගමනාගමන තත්වයන් පාලනය කිරිමට සහ එහි තම බලාධිකාරිය ස්ථාපිත කිරීම සඳහා යුධබලය වර්ධනය කරගැනීම සහ ක්‍රමෝපායිකව ස්ථානගතවීමට චීනය ප්‍රයත්න දරණ බව පැහැදිලිව විද්‍යාමානවේ. කෘතිමව දූපත් නිර්මාණය කරමින් සහ ඒවා යුධ හමුදාව රඳවන ස්ථාන බවට පත්කරමින් ඔවුන් මූලික වශයෙන් කළාපයේ භෞතික සහ දේශපාලනික වාතාවරණය/ස්වරූපය වෙනස් කිරීමට කටයුතු කරනු ලබයි. මේ අතර ඔවුන්  මෙම ඉදිකිරීම් සාධාරණීකරනය කිරීම සඳහා ඒවා ඉදිකරන්නේ ධීවරයින් මුදාගැනීමට සඳහා බවට ප්‍රචාරණයන් ගෙනයනු ලබයි. අද්මිරාල් හැරිස් පවසන ලෙසට මෙම ව්‍යාජ දිවයින් පිළිබඳව සැබෑ ජනතාව විශ්වාසය තබන්නේ නැත.

ජාතික මට්ටමේ නීති අන්තර්ජාතික තලයේ  තීරණ ගැනීම සම්බන්ධයෙන් යොදගැනීමට දරණ මෙම ආවේගකාරී ප්‍රයත්නයේ ප්‍රතිඵල පිළිබඳව පුදුමයට පත්විය යුතු නොවේ . අසල්වැසි රාජ්‍යයන් තුළ අනතුරක සේයාවක් ජනිත කරමින් කළාපයේ කණස්සල්ල සහ අස්ථාවරභාවය වැඩිවෙමින් පවතී. ජාතික ධනයෙන් විශාල ප්‍රමාණයක් උරුමක්කරුවන්/හිමිකරුවන්  සහ උරුමක්කරුවන් නොවන අය මාර්ගයෙන් මෙම ශක්තිමත් නාවික මූලස්ථාන සංවර්ධනය කිරීම සඳහා යොදවනු ලබයි. මෙය තම රටේ ආරක්ෂාව සඳහා අවශ්‍ය ආරක්ෂක ක්‍රියාමාර්ග ඉක්මවා යන්නකි.  මෙහිදී කණස්සල්ලට කරුණ වන්නේ ලෝකයේ පොදුවේ භාවිතා කළහැකි ස්ථානයන්ට බාධාවකින් තොරව පිවිසීමට පවත්නා අවකාශය පිළිබඳ මූලධර්මය රටවල් විසින් ඒකපාර්ශවීයව මෙම අවකාශයන් තම ආධිපත්‍යයට නතුකරගැනීම මගින් අවදානමට පත්වීමයි.  සීමිත සම්පත් ප්‍රමාණයක් හිමි,  යුද ශක්තිය අතින්  පැහැදිලිව ම අවාසිදායක තත්ත්වයක සිටින  කුඩා රටවලට, හුදෙක් බලහත්කාරයෙන් සිදුකරන ලබන ඉල්ලීම් නොකැමැත්තෙන් වුව පිළිගනිමින් සියලුම ජාතීන්ට නීතිත්‍යානුකූලව හිමි අයිතිවාසිකම් අත්හැර දමනු විනා වෙන විකල්පයක් නොමැත.

රටවල්/ ජාතීන් විසින් නිදහසේ සාගර තරණය සම්බන්ධයෙන්  සිදුකරනු ලබන ක්‍රියාවන්  නාවික ගමනාගමන ක්ෂේත්‍රයට කොතරම් බලපෑමක් ඇතිකරන්නේ ද?  සාගරය සම්බන්ධයෙන් කටයුතු සිදුකරන ආකාරයට රටවල් විසින්  අන්තර්ජාතික අවකාශයන් පාලනය කිරීමට තැත්කරන්නේ නම් අවකාශය සහ සයිබර් අවකාශය වැනි ලෝකය විසින් පොදුවේ භාවිතා කරන අවකාශයන් තවදුරටත් ආරක්ෂාකාරී නොවන බවට හැඟීමක් ඇතිවේ. එබැවින්  එක්සත් ජනපද ආරක්ෂක හමුදා අන්තර්ජාතික නීතියට අනුකූලව කටයුතු කරමින්  ලෝකය පුරාම පියාසර කිරීම, යාත්‍රාකිරීම සහ මෙහෙයුම් සිදුකරමින් එක් රටක්/ජාතියක අභිලාශයන් සඳහා ලෝකයේ සියලුම ජාතීන් විසින් ලබාගත යුතු වරප්‍රසාද යටපත් කිරීමට දරන ප්‍රයත්නයන් වැළැක්වීමට ක්‍රියාකරනු ලබයි.

මෙමගින් කියැවෙන්නේ ඇමෙරිකානු සහ චීන අභිලාශයන් අතර ප්‍රතිවිරුද්ධතාවයන් අඛණ්ඩව උත්සන්නවී නොවැළැවක්විය හැකි යුධ ගැටුමක් ඇතිවේ යන්න නොවේ. අපගේ අරමුණ වන්නේ චීනයේ යහපත් අනාගතය උදාවන්නේ සාමකාමීව සහයෝගයෙන් හා ඵලදායී සහභාගිත්වයෙන් දැනට පවත්නා නීති පදනම් කරගත් අන්තර්ජාතික නියෝග අනුව කටයුතු කිරීමෙන් සහ අන්තර්ජාතික

ප්‍රඥප්තීන්ට ගරුකිරීමෙන් බව චීනයට ඒත්තු ගැන්වීමයි. එබැවින් අපි අපිට හැකි සෑම අවස්ථාවකම සහයෝගයෙන් කටයුතු කරන අතර අභියෝගයන්ට මුහුණදීමටද සූදානම්ව සිටිමු.

අද්මිරාල් හැරිස් සෑමවිටම අවධාරණය කරනු ලබන්නේ චීනය සහ එක්සත් ජනපදය යම් ප්‍රගතියක් ඇතිකරගැනීම සඳහා එක්වී ක්‍රියාකිරීමට එකගවූ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් බලපෑමක් ඇති කරන්නාවූ කටයුතු වලට  ඉඩ ලබානොදිය යුතු බවයි.  එක්සත් ජනපදය සහ ඇත්ත වශයෙන්ම සියලුම ඉන්දු පැසිෆික් කළාපීය ජාතීන් අපිට හැකි සියලුම අවස්ථාවන්හි දී චීනය සමග සහයෝගයෙන් කටයුතු කිරීමට උත්සාහ කළයුතුයි.  මෙම සහයෝගයේ පදනමේ ආරම්භය සහ අවසානය විය යුත්තේ  අන්තර්ජාතික නීතියයි.

මෙහිදී උදාහරණයක් වශයෙන් මම දකුණු චීන මුහුද ඔබගේ අවධානයට යොමුකරමි. වසර ගණනාවක් පුරා එම ප්‍රදේශය කළාපීය ආරක්ෂාව පිළිබඳ සාකච්ඡාවන්හිදී ප්‍රමුඛ අවධානයට ලක්වී ඇති අතර අනෙක් අතට  එය ඉන්දියානු සාගර කළාපයේ නාවික කටයුතු පිළිබඳව පවත්නා අර්බුද සමතයකට පත්කරගත හැකි ප්‍රවේශයක් වශයෙන් යොදාගත හැකිබව මට පෙනීයයි.

ඉන්දියාවද ඇතුලුව මෙම කළාපයේ රටවල් බොහොමයක් දිර්ඝ කාලයක් පුරා අන්තර්ජාතික නීතියට අනුකූලව කටයුතු කරන බව විදහා දක්වා තිබේ.  ඉන්දියානු අග්‍රාමාත්‍ය මෝදි පවසා සිටියේ නාවික ගමනාගමනයේ නිදහසට සහ ජාත්‍යන්තර ප්‍රඥප්තීන් වලට අනුව කටයුතු කිරීම  භූගෝලීය වශයෙන් එකිනෙක හා සම්බන්ධවී ඇති ඉන්දු පැසිෆික් කළාපයේ සාමයට හා ආර්ථික වර්ධනය සඳහා අත්‍යාවශ්‍ය බවය. මෙහිදී විශේෂයෙන් වැදගත් වන්නේ වචන වලින් පමණක් නොව ක්‍රියාවෙන්ද මෙම උදාහරණය ඉන්දීය සාගරයේ ක්‍රියාත්මක කිරීමයි.

2012 වසරේදී සාගර නීතිය සම්බන්ධ ජාත්‍යන්තර අධිකරණය බංග්ලාදේශය සහ බුරුමය අතර මුහුදු සීමාව සම්බන්ධයෙන් පැවැති අර්බුදයට විසඳුම් ලබාදුන්නේය. මෙම අධිකරණ තීන්දුව මගින් අවතල මුහදු සීමාවක් පවතින බංගලාදේශයට නාවික සම්පත් භාවිත කිරීම  අවහිර කිරීමට බුරුමය දරණ ලද උත්සාහය නවතා දැමීමට හැකිවිය. සාගර නීතිය පිළිබඳ අන්තර්ජාතික අධිකරණය  මෙහිදී සහනයක් සලසමින් යම් නිශ්චිත සීමාවක් වෙන්කොට බංග්ලාදේශයට මුහුදු තීරයට ප්‍රවේශවීමට අවස්ථාව සලසාදෙන ලදී මේ අතර  එම සාගර ප්‍රදේශයට ඉහළින් පිහිටා ඇති ආර්ථික කළාපයේ පාලන බලය සම්පූර්ණයෙන්ම බුරුමයට ලබාදුන්නේය.  මෙම තීන්දුව මගින් සාන්ත මාර්ටින් දූපතේ බුරුමය පැත්තෙන් ඇති වෙරළ තීරය  සීමා කරමින් බංග්ලා දේශය එම දිවයිනෙන් ඔබ්බට තම ආර්ථික කළාපය ගෙන යාමේ ප්‍රයත්නයන් වළක්වාලීමටද කටයුතු කළේය. මෙම නියෝගය මගින් දෙපාර්ශයවම ප්‍රතිලාභ අත්වින්දේය.

වසර දෙකකට පෙර බේරුම් කිරීමේ විනිශ්චයාධිකරණය විසින් ඉන්දියාව සහ බංග්ලාදේශය අතර දිගුකාලයක් පුරා පැවැති නාවික ගමනාගමනය සම්බන්ධ අර්බුදය විසඳනු ලැබිණි. මෙහිදී ප්‍රශ්නයට ලක්වී තිබුනේ බංග්ලාදේශයේ බටහිර මායිමේ නාවික සීමාවය. මෙම අධිකරණ තීන්දුව මගින් බංග්ලාදේශයට ඔවුන් විසින් ඉල්ලා සිටි ආර්ථික කළාපයේ 80%ක් ලබාදෙන ලදී. වඩාත් විශාල සහ බලවත් රටක් වුවත් ඉන්දියාව විසින් මෙම අධිකරණ තීන්දුව පිළිගන්නා ලදී. මෙමගින් සියලු දෙනා එකඟවූ අර්බුද විසඳීමේ යාන්ත්‍රණයන්ට අනුකූලව කටයුතු කරන බව සහ මෙම නිතියට අනුව කටයුතු කිරීම මගින් ඉන්දියාව මෙම කළාපයේ නායකයා වශයෙන් කළාපීය ආරක්ෂාව සහ ස්ථාවරත්වය නංවාලීමට සහ අනෙකුත් කටයුතු වලදී සහයෝගයෙන් කටයුතු කිරීමට ඇති කැමැත්තද පෙන්නුම් කළේය.

සියලු දෙනා එකට එක්වී සාමුහිකව  විසඳා ගතයුතු අභියෝගයන් පවත්නා වාතාවරණයකදී  මෙවැනි ආකාරයේ සහයෝගීතාවක් ඉතා වැදගත්වේ. අප සියලු දෙනාටම ජාතින් වශයෙන් සෞභාග්‍ය උදාකරලීමට සහ ජීවන තත්වය උසස් කරලීමට අවස්ථාවන් උදාකරන මෙම සාගරය රාජ්‍ය නොවන වෙනත් පාර්ශවයන්ට ඔවුන්ගේ  අවශ්‍යතා වෙනුවෙන් දූෂණකාරී ක්‍රියාවන්හි නිරතවීමටද ඉඩප්‍රස්ථා උදාකරයි. මෙවැනි එක් අවස්ථාවක් ලෙස මුහුද කොල්ලකරුවන් දැක්විය හැකිය. මුහුදු කොල්ලකරුවන් ඉන්දීය සාගර කළාපයද ඇතලුව ඉන්දු ආසියානු සහ පැසිෆික් කළාපයේ ක්‍රායාත්මකවේ. දිගුකාලයක් පුරා

බටහිර ඉන්දියන් සාගරයේ මුහුදු කොල්ලකරුවන් සහ ආයුධ සන්නද්ධ කණ්ඩායම් විසින් සිදුකරනු ලබන පැහැරගැනීම් මගින් සෝමාලියාවට මානුෂීය ආධාර සැපයීමට, අතිශයින් වැදගත් මුහුදු මාර්ග සන්නිවේදනයට බාධා පැමිණවීම සහ අප්‍රිකා තුඩුවේ සහ ඒඩන් ගල්ෆ් කළාපයේ ආර්ථික අභිමතාර්ථ වලට අයහපත් බලපෑම් සිදුවීම මෙන්ම 2012 වසරේ පමණක් රජයයන්ට සහ නාවික සමාගම් වලට ඩොලර් බිලියන 7 පිරිවැයක් දැරීමටද සිදුවිය.

නාවික කටයුතු වල නිරත රටවල් සහ ඔවුන්ගේ නාවික හමුදාවන්, නාවික කර්මාන්තයේ භාවිතාවන් හා ප්‍රතිපත්තීන් සහ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ යෝජනාවන් මගින් මේ සම්බන්ධයෙන් ගන්නා ලද සාමූහික ක්‍රියාකාරකම් මෙම තර්ජනය පාලනය කළ හැකි මට්ටමකට අඩුකිරීමට හේතුවී ඇත. නමුත් විශේෂයෙන් සාගරකළාප මායිම් ප්‍රදේශයන් ද ඇතුළත්ව මුහුදු මංකොල්ලකෑම් ලෝකයේ සාගරවල අඛණ්ඩව පවත්නා අභියෝගයක් ලෙසින් දක්නට ලැබේ.

රටවල් තමන්ගේ සම්පත් මුහුදු මංකොල්ලයන් වැළැක්වීමේ මුරසංචාර සඳහා යෙදවීමත්, නාවික කර්මාන්තය නැවතත් දැඩි අවදානම් කළාප හරහා වැටී ඇති තමන්ගේ පාරම්පරික මුහුදු මාර්ග භාවිතා කිරීම ආරම්භ කිරීමත් සමගින් භාණ්ඩ ප්‍රවාහන නෞකාවන් හොඳ ඉලක්කයන් බවට පත්වී ඇත. මේ අනුව මුහුදු මංකොල්ලයන් සහ ආයුධ සන්නද්ධ පැහැරගැනීම් වැනි සිදුවීම් වර්තමානයේද සිදුවිය හැකිය. මෙය සිහියේ තබාගෙන කළාපීය නාවික හමුදාවන් සහ වෙරළාරක්ෂකයින් මුහුදු මංකොල්ලයන් වළක්වාලීමට දැඩි පියවර ගත යුතු අතර සීමිත සම්පත් වලින් උපරිම ප්‍රතිඵල ලබාගැනීම සඳහා මෙම විශාල ප්‍රදේශයේ මෙහෙයුම් වලදී සහයෝගයෙන් ක්‍රියාකළ යුතුව තිබේ.

නැගෙනහිර ඉන්දීය සාගර ප්‍රදේශය මුහුදු මංකොල්ලයන් මැඩලීම සඳහා සහයෝගයෙන් ක්‍රියාකිරීම පිළිබඳව කදිම උදාහරණයකට ගත හැකිය. ඉන්දුනීසියාව, මලයාසියාව, සිංගප්පූරුව සහ තායිලන්තය විසින් වසර 10 කට පෙර සහයෝගයෙන් ආරම්භ කරන ලද මලක්කා සමුද්‍ර ප්‍රදේශයේ මුර සංචාරයන් මගින් මෙම ප්‍රදේශයේ මුහුදු මංකොල්ලකෑම් සිදුවන අවස්ථාවන් සංඛ්‍යාව කැපීපෙනෙන ලෙස අඩු කිරීමට හේතුවී ඇත.

නාවික කටයුතු සම්බන්ධ අනෙකුත් අභියෝගයන් මෙන්ම මුහුදු මංකොල්ලයන්ට එරෙහිව සිදුකරන්නාවූ අනාගත මෙහෙයුම්ද මුහුදේ ඇතිවන ගැටුම් උත්සන්න කිරීමට මග පාදන ගොඩබිම් සාධක වලට විසඳුම් ලබාදීම මත රඳා පවතිනු ඇත. නීතිය ක්‍රියාත්මක නොවීම, දරිද්‍රතාවය සහ මානුෂීය අර්බුදයන් පවා මුහුදු මංකොල්ලකෑම් වලට මගපාදන තත්වයන් ඇති කිරීමට හේතු වනු ඇත.

රටවල් වල/ගොඩබිමේ නීතිය ක්‍රියාත්මක නොවීම මගින් ත්‍රස්තවාදය වැනි අනෙකුත් අභියෝගයන්ද උත්සන්න විය හැකිය. මෙමගින් ඇතිවන තත්වයන් ඒවාට මුලින් හටගත් රටවල් වලින් ඔබ්බටද ගොස් අනෙකුත් රටවල් වල ආරක්ෂාවටද ප්‍රශ්න ඇතිවිය හැකිය.

මේ සඳහා අපට ලබාදිය හැකි හොඳම උදාහරණය වන්නේ අයි එස් අයි එස් (ඉරාකය සිරියාව ඉස්ලාම් රාජ්‍ය) ත්‍රස්ත්‍රවාදයයි. එක්සත් ජනපදයේ මූලිකත්වයෙන් සිදුවන මෙම ත්‍රස්තවාදය මැඩලීමේ ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් මැදපෙරදිග සහ උතුරු අප්‍රිකා භූගෝලීය ප්‍රදේශ ඉලක්ක කරගන්නා අතර අඛණ්ඩව ක්‍රියාත්මකවන යුධක්‍රියාමාර්ග මගින් එම ප්‍රදේශවල අයි එස් අයි එස් ත්‍රස්තවාදය තුරන් කිරීමට ප්‍රයත්න දරනු ලැබේ. මේ අතර ආයුධ සන්නද්ධ මූලධර්මවාදී ත්‍රස්තවාදීන් මෙම ප්‍රදේශ වලින් පැනගොස් වෙනත් ප්‍රදේශ වල අලුතින් සටන් කරුවන් බිහිකරලීමට/පෙළඹවීමට උත්සාහ දරන බව අපිට නිරීක්ෂණය කළ හැකියි. මෙම කළාප වලට ඉන්දු ආසියා පැසිෆික් රටවල්ද ඇතුළත්ය.

අයි එස් අයි එස් ත්‍රස්තවාදය පැහැදිලි තර්ජනයක් වන අතර එය තුරන් කළ යුතුමය. කණගාටුදායක ලෙසින් වර්තමානයේ දකුණු පිලිපීනයෙන්ද ප්‍රචණ්ඩකාරී මතවාදයන් පැනනැගෙන අයුරු අපිට දැකිය හැකිය. 2016 වසරේදී අබු සයිඩ් කණ්ඩායමේ අණදෙන්නාවූ ඉස්නිලොන් හැපිලොන් ගිණිකොණ දිග ආසියාවේ අයි එස් අයි එස් එමිර්වරයා ලෙස නම් කරන ලදී. එයින් මාස ගණනකට පසුව ප්‍රචණ්ඩකාරී අන්තවාදී කණ්ඩායම් ගණනාවක් එක්සත් කරමින් අයි එස් අයි එස් ධජය යටතේ සන්ධානයක් ගොඩ

නැගීමට හැපිලොන් ක්‍රියාකලේය. මින්දනාවෝ දූපත් වලව මරාවි නගරයේ ඝාතන සිදුකිරීම සඳහා මෙම ත්‍රස්ත්‍රවාදීන් මැදපෙරදිගදි භාවිතා කළ උපක්‍රමයන් උපයෝගී කරගනු ලබන බව අප නිරීක්ෂණය කලෙමු අයි එස් ත්‍රස්තවාදීන් විසින් පොළඹවනු ලැබූ කණ්ඩායම් පළමුවරට ඉන්දු ආසියා පැසිෆික් කළාපයේ මෙවැනි පරිමානයේ ත්‍රස්තවාදී ක්‍රියා සිදුකිරීමට එක්රුස්වී කටයුතු කරනු ලබයි.

නෝනාවරුනි මහත්වරුනි, මරාවි සිදුවීම් ඉන්දු ආසියා පැසිෆික් රටවල් වලට අවදියෙන් සිටීමට සිදුකරනු ලැබූ සංඥාවක් ලෙසින් හැඳින්විය හැකියි. විදේශ සටන්කරුවන් ඔවුන්ගේ මතවාදයන්, සම්පත් සහ ක්‍රමවේදයන් දේශීය සහ ඊලග පරම්පරාවේ සටන් විප්ලවවාදීන් වෙත සම්ප්‍රේෂණය කරමින් සිටී. එම නිසා අපි අයි එස් අයි එස් ද ඇතුලුව ඔවුන් වැනි සියලුම ප්‍රචණ්ඩකාරී අන්තවාදී කණ්ඩායම් අපට තව තවත් තර්ජන සහ අනතුරු සිදුකිරීමට පෙර අද අදම ම තුරන් කළ යුතුයි. නමුත් මෙය අපිට තනිවම සිදුකළ නොහැකියි. අයි එස් අයි එස් තවදුරටත් මෙම කළාපයේ ව්‍යාප්තතවීමට පෙර එය තුරන් කළ හැක්කේ විවිධ ජාතීන් අතර ඇතිවන්නාවූ සහයෝගීතාවයෙන් පමණකි.

මේ අභියෝගයන් ජයගැනීම සඳහා බහුජාතික ක්‍රියාමාර්ග මේ වනවිටත් සිදුවෙමින් පවතී. ඉන්දුනීසියාව, මලයාසියාව සහ පිලිපීනය කළාපයේ මුහුදු මංකොල්ලකෑම් සහ සුලු මුහුදේ සිදුවන කප්පම් ගැනීම සඳහා පුද්ගලයින් පැහැරගෙනයාම වළක්වා ලීමට සහයෝගයෙන් ක්‍රියාකරනු ලබයි.

මෙම රටවල් තුන සහ ඔවුන්ගේ දහස් ගණනාක් වූ දූපත් එකිනෙක හා සම්බන්ධ කරගනිමින් සහයෝගීතාවයෙන් ගනු ලබන්නාවූ ප්‍රයත්නයන් තුළින් මෙම විශාල සාගර කළාපයේ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම්, බඳවා ගැනීම සහ ඔවුන්ගේ ආදායම් මාර්ග වළක්වාලීමට උපකාරී වනු ඇත. පිලිපීනයේ සන්නද්ධ හමුදා සහාය ද ඇතුලුව මෙම පාර්ශවකරණය ත්‍රස්තවාදී කණ්ඩායම් වලට එරෙහිව ක්‍රියාත්මක වීම සඳහා ගනු ලැබූ තවත් ඵලදායී ක්‍රියාමාර්යක් වේ.

සිංගප්පූරුව සහ ඉන්දුනීසියාව අතර පවත්නා සහයෝගය ඉතා උසස් මට්ටමක පවතී. මෙම රටවල් දෙක අතර පවත්නා සහයෝගීතාවය නිසා අයි එස් අයි එස් හා සම්බන්ධකම් පවත්වන ත්‍රස්තවාදීන් විසින් සිංගප්පූරුවේ ප්‍රහාරයක් එල්ල කිරීම සඳහා සකස් කරන ලද සැලැස්මක් ව්‍යාවර්ථ කිරීමට ඉන්දුනීසියානු ආරකෂක අංශ සමත්වී ඇත.

මෙම උදාහරණයන් ගෙනහැර දක්වීම මගින් මම අපේක්ෂා කරන්නේ කළාපයට දැඩි බලපෑමක් එල්ල කරන්නාවූ අභියෝගයන් හිදී සහයෝගයෙන් සහ සියලුදෙනා අන්තර්කරණයෙන් යුතුව ගනුලබන්නාවූ ක්‍රියාමාර්ගයන්හි වටිනාකමය. ඒකාබද්ධ මුර සංචාර, සියලුදෙනා අන්තර්කරණය වූ යුධ අභ්‍යාස සහ ස්ථාවර අන්දමින් සම්බන්ධකම් පැවැත්වීම මගින් මුහුදු මංකොල්ලයන් තුරන් කිරීමට, වෙළඳ හා නාවික ගමන් මාර්ග ආරක්ෂා කිරීමට, ත්‍රස්තවාදය වළක්වාලීමට සහ ස්වභාවික ආපදා අවස්ථාවන්හිදී මානුෂීය සහයෝගයන් ලබාදීමට අපට පවත්නා හැකියාව වර්ධනය කරනු ලබයි .මෙම ක්ෂේත්‍රයන්හි සහයෝගයෙන් ක්‍රියාත්මකවිය හැකිමාර්ග පිලිබඳව එක්සත් ජනපදය අඛණ්ඩවම අවධානය යොමු කරනු ලබයි.

මෙම පණිවිඩය මගින් අපගේ ස්ථාවරත්වය සහ සෞභාග්‍ය රඳාපවතින්නාවූ ආරක්ෂාව සුරක්ෂිත කිරීම සම්බන්ධයෙන් අප සියලුදෙනාටම පවත්නා වගකීම පිළිබඳව නැවතත් මතක් කරනු ලබයි .